# ඓතිහාසික මූලාශ්‍රය වලින් හෙළිවන පුරාණ ලංකාවේ නැකත් භාවිත කිරීම පිළිබඳ විමර්ශනයක් ( අනුරාධපුර යුගය ඇසුරින් )

එම්.ඩබ්.එන්.ටී.සුමනසේන, එච්.එල්.ජයශානි
කැලණිය විශ්වවිද්‍යාලය
nuwan.medawattha@gmail.com

ලාංකික ජනයා ඈත අතීතයේ සිටම අත්භූත වස්තු හා සිද්ධි කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. මෙම අත්භූත වස්තු හා සිදුවීම් තාර්කිකව විග්‍රහ කරමින් ජන සංස්කෘතිය සමඟ එය සමීප කරවීමට නක්ෂත්‍ර ක්ෂේත්‍රයෙන් මනා පිටිවහලක් ලැබේ. මහින්දාගමනය සිදුවන තෙක්ම ලාංකේය ජනයා තම ජන ජීවිතයේ වැදගත් අංගයන් නක්ෂත්‍ර ක්ෂේත්‍රයට අනුව සිදුකරනු ලැබූහ. මෙම නක්ෂත්‍ර ක්ෂේත්‍රය බ්‍රාහ්මණයන් හෙවත් නක්ෂත්‍රකරුවන් මඟින් වඩාත් ව්‍යාප්ත විය. මහින්දාගමනයෙන් පසුව නක්ෂත්‍ර ක්ෂේත්‍රය තරමක් පසුබෑමකට ලක් වුව ද පසුකාලයේ භික්ෂූන් වහන්සේලා ද මෙම ක්ෂේත්‍රයට නැඹුරු වූ ආකාරය කැපී පෙනේ. ඒ අනුව මෙම නක්ෂත්‍රය මහින්දාගමනයෙන් නොනැවතී වර්තමානය දක්වාම බුදු දහම හා හින්දු ආගම සමඟ සම්බන්ධ වී පැමිණ තිබේ. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වූයේ අනුරාධපුර මුල් භාගයේ සිට අවසන් භාගය දක්වා ලාංකික ජනයා නක්ෂත්‍රය භාවිතා කළ ආකාරය පිළිබඳව විමර්ශනය කිරීමයි.
මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය ලෙස සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම පුරාවිද්‍යා මූලාශ්‍රය ද අධ්‍යයනය කරනු ලැබිණි. මෙම පර්යේෂණය මඟින් අනුරාධපුර මුල් යුගයේ පණ්ඩුකාභය රාජ්‍යය අවධියේ සිටම ලාංකිකයන් මෙම නක්ෂත්‍රය භාවිතා කළ බව සනාථ විය. එමෙන්ම බුදු දහම වඩාත් ව්‍යාප්ත වූ දුටුගැමුණු යුගයේ හා වසභ රාජ්‍යය කාලයේ ද මෙම නක්ෂත්‍රය භාවිතා කළ බව මෙමඟින් සනාථ විය. පණ්ඩුකාභය රාජ්‍යය අවධියට පෙර සිටම මෙම නක්ෂත්‍රය භාවිතා කළ බවට සාධක ලැබෙන අතර එය චිත්‍රා කුමරියගේ කතා පුවතින් ගම්‍ය වේ. පසුකාලයේ පුද්ගල නාම භාවිතයේදී මෙන්ම වැව් ඉදිකිරීමට ද ගොඩනැගිලි ඉදිකිරීමට ද මෙම නක්ෂත්‍රය උපයෝගී කරගෙන තිබේ. දුටුගැමුණු රාජ්‍යය අවධියේදී බුදු දහම සමඟ මෙම නක්ෂත්‍ර ක්ෂේත්‍රය වඩාත් සමීපව කටයුතු කළ ආකාරය කැපී පෙනේ. දුටුගැමුණු කතා පුවත ආරම්භයේ සිට අවසානය දක්වා පවතින දුටුගැමුණු කුමාර උපත, රුවන්වැලිසෑය ඉදිකිරීම වැනි විශේෂ අවස්ථාවලදී මෙම නක්ෂත්‍රය භාවිතා කළ බවට ගම්‍ය වේ. වසභ රාජ්‍යය සමයේදී රජ පදවියට බලපෑම් කිරීමට ද නක්ෂත්‍රය සමත් වී තිබේ. මේ ආකාරයට මෙම පර්යේෂණය තුළින් අනුරාධපුර මුල් යුගයේ සිට අවසාන කාලය දක්වා නක්ෂත්‍රය භාවිතා කළ ආකාරය පිළිබඳව අවබෝධ කරගත හැකිය.

**ප්‍රමුඛ පද:** ශ්‍රී ලංකාව; අනුරාධපුර යුගය; නක්ෂත්‍රය; නක්ෂත්‍රකරුවන්